ම... / ...ளாளர் / ...tary } + 94-11- 2877841

කාර්යාලය / அலுவலகம் / Office } + 94-11-2877842

සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය
சமூக நலன்புரி மற்றும் ஆரம்ப கைத்தொழில் அமைச்சு
Ministry of Social Welfare and Primary Industries

...ෆ් / ...ஸ் / ...lo. } + 94-11-2885380

ෆැක්ස් / பெக்ஸ் / Fax No. } + 94-11-2877845


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } NSE/DEV/03/04 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2018.10.15 |

චක්‍රලේඛ අංක : NSE/EL/01/2018

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්, පළාත් සමාජ සේවා අධ්‍යක්ෂවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය</u>

<u>වයස අවුරුදු 70 ඉක්මවූ අඩු ආදායම්ලාභී වැඩිහිටියන්ට රු.2,000/- ක මාසික දීමනාවක් ගෙවීම.</u>

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ අංක BD/RDS/124/EST/2014 හා 2014.12.23 දිනැති ලිපියට අනුව වයස අවුරුදු 70ට වැඩි, අඩු ආදායම්ලාභී වැඩිහිටියන්ට රු.2,000/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ. මෙහිදී මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2013.06.24 දිනැති අයවැය චක්‍රලේඛ අංක 161 හි 3 ඡේදයෙහි දක්වා ඇති පරිදි මෙම දීමනාව ලැබීම, අනෙකුත් ලබමින් සිටි දීමනාවන් අහෝසි වීමට හේතුවක් නොවේ.

මෙම චක්‍රලේඛය නිකුත්වීමත් සමග මගේ අංක MSS/ADM/10/2/10 හා 2016.01.12 දිනැති 1/2016 චක්‍රලේඛය අවලංගු වේ.

<u>2. රු.2,000/- මාසික දීමනාව ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය</u>

2.1 මෙම දීමනාව හිමි පුද්ගලයන් තීරණය කිරීමේදී පහත නිර්ණායක උපයෝගී කර ගත යුතුය.

2.1.1 වයස අවුරුදු 70 සම්පූර්ණ වී තිබීම.

2.1.2 පුද්ගල මාසික ආදායම හෝ පවුලේ මාසික ආදායම රු.3,000/- හෝ ඊට අඩු වීම. පවුල යන්නට තම දරුවන් සමඟ එකම ගෘහයක ජීවත්වීම දැක්වේ.

2.1.3 විවාහක, අවිවාහක හෝ වැන්දඹු වයස අවුරුදු 70 සම්පූර්ණ වූ සුදුසුකම් ලබා ඇති පුද්ගලයන් කිහිපදෙනෙකු එකම ගෘහයක් තුළ ජීවත් වන්නේනම් 2.1 අනුගමනය කරමින් එකිනෙකා වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් මෙම දීමනාව ලබා දිය හැකිය. මෙහිදී එක් ගෘහයක් සඳහා දීමනාලාභීන් සංඛ්‍යාව 02 කට සීමා විය යුතුය. නමුත් ස්වාමිපුරුෂයා සහ භාර්යාව යන දෙදෙනාම සුදුසුකම් සපුරා දීමනාව සඳහා ඉල්ලුම් කළ ද, දීමනාව ලබා දිය යුත්තේ දෙදෙනාගෙන් එක් අයෙකුට පමණි.

2.2 2016 ජනවාරි මස සිට වැඩිහිටියන්ගේ සුබසාධනය වෙනුවෙන් සෑම දිමනාලාභියකුගේම දීමනාවෙන් රු.100/-ක මුදලක් මාසිකව වෙන් කිරීමට වැඩිහිටි කැනැත්තන් සඳහා වූ ජාතික සභාව තීරණය කර ඇති අතර, සෑම මසකම එම මුදල වෙන්කොට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් පවත්වාගෙන යනු ලබන බත්තරමුල්ල, ලංකා බැංකු ශාඛාවේ පවතින වැඩිහිටියන්ගේ සුබසාධනය සඳහා වන ජාතික අරමුදලට බැර කල යුතුය. මෙම අරමුදලට බැර කිරීමට අදාල චෙක්පත "වැඩිහිටියන්ගේ සුබසාධනය සඳහා වන ජාතික අරමුදල , ගිණුම් අංක 228075" නමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත පහත සඳහන් ආකෘතියට අනුව මාසිකව එවීමට ප්‍රාදේශීය ලේකම්වරු විසින් කටයුතු කළ යුතු අතර, ගෙවීම් ලේඛන සකස් කරන අවස්ථාවේදීම රු.100/- ක මුදල අඩුකරණය කළ යුතුය. ඒ අනුව දීමනාලාභීන් වෙත මාසිකව ගෙවිය යුතු මුදල රු.1,900/- ක් වේ.

ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය - ..........................................................................

මාසය - ..........................................

| ප්‍රතිලාභී සංඛ්‍යාව | අදාල මුදල (රු) | චෙක්පත් අංකය | චෙක්පත් දිනය |
|---|---|---|---|
| | | | |

2.3 අඩු ආදායම්ලාභියෙකු බව තහවුරු කිරීමේදී දීමනාලාභී නාමලේඛනය අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරියෙකුගේ ප්‍රධානත්වයෙන් යුතු ප්‍රාදේශීය කමිටුවකින් සිදු කළ යුතු අතර, අඩු ආදායම්ලාභීන් හඳුනා ගැනීමේදී වසමෙහි ග්‍රාම නිලධාරි සමග සමාජ සේවා නිලධාරි / පළාත් සමාජසේවා නිලධාරි/වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර / සංවර්ධන නිලධාරී යන අය විසින් අනිවාර්යයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකර, එම පරීක්ෂණ වාර්තාව ග්‍රාම නිලධාරි ඇතුළුව තවත් ඉහතින් සඳහන් කරන ලද එක් නිලධාරියකුගේ නිර්දේශ සහිතව කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

2.4 2018 අප්‍රේල් මස සිට අනුමත සංශෝධිත දීමනාලාභීන් සංඛ්‍යාව ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට හිමි දීමනාලාභීන් සංඛ්‍යාව වේ. ඒ අනුව ඉදිරි මාසයන් තුළද එම සංඛ්‍යාව පවත්වාගෙන යා යුතු අතර, පදිංචිය හැරයාම හැර වෙනත් හේතුවක් මත ලේඛනයෙන් ඉවත්වන දීමනාලාභීන් වෙනුවට පොරොත්තු ලේඛනයේ ඊළඟට ඉහළම සුදුසුකම් ලබන අය ඊට ඇතුළත් කළ යුතුය. දීමනාලාභීන් තම පදිංචි දිස්ත්‍රික්කය මාරුකිරීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි ඉහත සංඛ්‍යාව වෙනස් විය හැකිය.

උදාහරණ ලෙස :- 2018 අප්‍රේල් මස සිට තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අනුමත දීමනාලාභීන් සංඛ්‍යාව 1000 ක් නම් එය ඉදිරි මාස කිහිපය පුරාම එම සංඛ්‍යාව පවත්වාගෙන යා යුතුය.(දීමනාලාභීන් පදිංචිය මාරු කිරීම හේතුවෙන් මෙම සංඛ්‍යාව වෙනස් විය හැක) පදිංචිය හැරයාම හැර ලේඛනයෙන් අයෙක් ඉවත් වුවහොත් පොරොත්තු ලේඛනයෙන් ඊළඟට සුදුසුකම් ලබා ඇති අය ඇතුලත් කොට ගෙවීම් කළ යුතුය.

2.5 එක් දීමනාලාභියකු මියගියහොත් හා වෙනත් ක්‍රමයකින් නුසුදුසු පුද්ගලයකු වීම නිසා දීමනා ක්‍රමයෙන් ඉවත් කළහොත් දීමනාලාභියාගේ NSE/DEV/EL/MA දරණ දීමනා ගෙවීම් සහතික පත්‍රය අවලංගු කොට එය සුරක්ෂිතව අදාළ ප්‍රාදේශීය ලේකම් භාරයේ තබා ගත යුතුය.

2.6 දීමනාලාභියකු මියගිය වහාම හෝ වෙනත් හේතුවක් මත දීමනා ක්‍රමයෙන් ඉවත්කිරීමේදී දීමනාව අත්හිටුවා එම තොරතුරු විධිමත් පරිදි ලේඛන ගත කළ යුතුය.

2.7 දීමනාලාභියා මියගිය හොත්, කලත්‍රයා ජීවත්ව සිටීනම් සහ වයස අවුරුදු 70 ඉක්මවා ඇත්නම් දීමනාව ඇය/ඔහු වෙත ලබා දිය යුතුය. මෙහිදී සොයරොත්තු ලේඛනගත වීමක් අවශ්‍ය නොවේ.

2.8 දැනටමත් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් හඳුන්වා දී තිබෙන අංක NSE/DEV/EL/MA දරණ දීමනා ගෙවීම් සහතික පත්‍රය තවදුරටත් භාවිතා කළ යුතුය.

2.9 දීමනා ගෙවීමේදී අවශ්‍ය වන දීමනා ගෙවීම් සහතිකපත්‍ර ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැබීමට කටයුතු කරනු ඇත.

2.10 ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නිකුත් කරනු ලබන දීමනා ගෙවීමේ සහතික පත්‍රය අනුව දීමනාලාභීන්ට මාසික දීමනාව උප තැපැල් කාර්යාල හා තැපැල් කාර්යාල මඟින් පමණක් ලබාගත හැක.

2.11 2018 වර්ෂය සඳහා පැරණි දීමනා ගෙවීම් සහතික පත්‍රයම භාවිතා කළ යුතු වේ.

2.12 දීමනාලාභියෙකුගේ දීමනා ගෙවීමේ සහතික පත්‍රය නැතිවූ අවස්ථාවකදී ග්‍රාම නිලධාරීගේ නිර්දේශයක් සහ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව නැවත ගෙවීමේ සහතික පත්‍රයක් නිකුත් කළ යුතුය. එහි "පිටපතකි" යනුවෙන් සඳහන් කළ යුතුවේ.

2.13 කිසියම් දීමනාලාභියෙකු වෙනුවෙන් නියෝජිතයකු අවශ්‍ය වන්නේනම් ග්‍රාම නිලධාරීගේ නිර්දේශයක් සහ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව පත්කළ හැකි අතර, එම නියෝජිතයාගේ තොරතුරු විධිමත් පරිදි ගෙවීම් සහතික පත්‍රයේ ඇතුළත් කළ යුතුය.

2.14 කිසියම් දීමනාලාභියෙකු අදාළ මාසය තුළ දීමනාව ලබා නොගත්තේ නම් එය නැවත ගෙවනු නොලැබේ.

දීමනාලාභියකුට හදිසි අසනීප තත්වයක් හෝ වෙන යම් සාධාරණ හේතුවක් මත දීමනාව ලබා ගැනීමට නියමිත දිනයන් තුළ යාමට නොහැකි වන බව කල්තියා හැඟියන්නේනම්, එවැනි අවස්ථාවකදී එම දීමනාලාභියා වෙනුවෙන් "නියෝජිතයකුට" ග්‍රාමනිලධාරීගේ නිර්දේශය සහ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිත ලිපියක් හරහා දීමනාව ලබා ගැනීමට කටයුතු කළ හැකිය.

එසේම, යම් සාධාරණ හේතුවක් මත දීමනාලාභියකු හට දීමනාව අදාල මස, මාස 02 ක් ක් තුල ලබා ගැනීමට නොහැකිවුයේනම්, කම්ටු නිර්දේශය මත ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියට යටත්ව

2.15 කිසියම් දීමනාලාභියෙකු මාස 03 ක් අඛණ්ඩව තම දීමනාව ලබා නොගත්තේ නම් ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය කමිටුව මගින් තීරණය කොට, අදාල දීමනාලාභියාගේ නම, දීමනා ගෙවීම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. මේ සඳහා පිළිගත හැකි හේතු තිබිය යුතු අතර, එම තොරතුරු විධිමත් පරිදි සමාජ සේවා අංශය විසින් ලේඛණ ගත කළ යුතුය.

2.16 දීමනාව ලබා ගැනීමේදී කිසියම් දීමනාලාභියකු විසින් අසත්‍ය තොරතුරු සපයා ඇති බවට අනාවරණය වුවහොත් ප්‍රාදේශීය කමිටුවේ නිර්දේශය මත දීමනාව අත්හිටුවා, ඊට අදාල හේතු සහිත තොරතුරු නිසිපරිදි ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අනුඅත්සන් කරන ලද සටහන් සහිතව තබා ගත යුතුය.

2.17 දීමනා ගෙවීම් සහතික පත්‍ර අනුක්‍රමික අංක ක්‍රමය පහත ලෙස භාවිතා කිරීම කළ යුතුය.

NSE/පළාත/ දිස්ත්‍රික්කය/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය/ අනුක්‍රමික අංකය.

NSE/බස්නාහිර පළාතේ/ කොළඹ දිස්ත්‍රික්කයේ/ කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ/ පළමු ප්‍රතිලාභියා

උදා : NSE/WP/C/C/001 ලෙස, ලියාපදිංචි කළ යුතුය.

2.18 දීමනාව සඳහා සුදුසුකම් ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අදාල අයදුම්පත් සම්පූර්ණ කර සුරක්ෂිතව ප්‍රාදේශීය ලේකම් භාරයේ තබාගත යුතුය.

3. *<u>වැඩිහිටි නිවාසවල සිටින වයස අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන් සඳහා රු.2,000/- ක මාසික දීමනාව ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය</u>*

3.1 ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ / පළාත් සමාජසේවා දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති, නොමිලේ නේවාසිකයන් රැකබලා ගන්නා, රජයේ ජීවනාධාර අනුග්‍රහ නොලබන වැඩිහිටි නිවාසවල වයස අවුරුදු 70 සම්පූර්ණ වී ඇති ජ්‍යෙෂ්ඨ පුරවැසියන් මෙම දීමනාව ලැබීමට සුදුසුකම් ලබයි.

3.2 මෙහිදී අදාළ මුදල වැඩිහිටි නිවාසයේ පාලක සභාව වෙත ලබා දීමට කටයුතු කළ යුතු අතර, එම මුදල නේවාසික වැඩිහිටියන්ගේ ආහාරපාන සහ අවශ්‍ය ඖෂධ ලබාදීම වෙනුවෙන් යෙදවීමට උපදෙස් ලබා දිය යුතුය. එමෙන්ම එම මුදල ඉහත අවශ්‍යතා වෙනුවෙන් වියදම් කළ බවට නිවාසයෙහි පාලක සභාව විසින් සහතික විය යුතුය. සුදුසුකම් ලබන නේවාසික වැඩිහිටි සංඛ්‍යාව සහ ඔවුන්ගේ තොරතුරු ඇතුලත් ලේඛනය අදාළ නිවාසයේ පාලකගේ අත්සනින් යුතුව ප්‍රාදේශීය කමිටුවෙහි නිර්දේශය සහිතව සහ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සමගින් ලබා ගත යුතුය.

3.3 සෑම මසකම ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිත දීමනාව ලබන නේවාසිකයන්ගේ ගෙවීම් නාම ලේඛනයෙහි පිටපතක් පළාත් සමාජසේවා අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය.

3.4 මධ්‍යම රජය යටතේ සහ පළාත් රාජ්‍ය යටතේ පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස සඳහා, එම රාජ්‍ය ආයතන විසින් නඩත්තුව සිදුකරන බැවින්, ඒවායෙහි නේවාසික වයස අවුරුදු 70 ඉක්මවූ වැඩිහිටියන් මෙම දීමනාව සඳහා හිමිකම් නොලබයි.

**4. දීමනාලාභීන්ට අනන්‍යතාවය තහවුරු කර දීම / දීමනා ගෙවීම් සහතික පත්‍ර ලිවීම**

4.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් හෝ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් නිකුත් කරන ලද හැඳුනුම්පතක් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් පුද්ගලිකව සහතික කරන ලද ඡායාරූපයක් මඟින් දීමනාලාභීන්ගේ අනන්‍යතාවය පිළිබඳ සෑහීමකට පත් විය හැක. දීමනා ගෙවීම් සහතික පත්‍රයේ අදාල කොටස නිසි ලෙස සම්පූර්ණ කර ප්‍රාදේශීය ලේකම් විසින් නිල මුද්‍රාව තබා අත්සන් කළ යුතුය.

**5. ගෙවීම් ක්‍රියාවලිය**

5.1 මෙම දීමනාව ගෙවීම සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දීමනාලාභීන් සංඛ්‍යාව ඇතුලත්ව ඉදිරිපත් කරනු ලබන ලේඛනයට අනුව සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන ලබා දෙන අතර, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් විසින්ම මාසිකව තම දීමනාලාභීන් සංඛ්‍යාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත දැන්විය යුතුයි.

5.2 ඒ අනුව, ඒ ඒ දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් මෙම දීමනාව මාසිකව ගෙවීමට අවශ්‍ය වන අක්මුදල් ප්‍රමාණය සෘජුවම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙතින් ලබාගත යුතුය.

5.3 සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින්ම මෙසේ වෙන් කරනු ලබන ප්‍රතිපාදන උපයෝගී කොට ගෙන ගෙවූ දීමනා පිළිබඳ තොරතුරු ඇතුලත්ව ආකෘති පත්‍ර අංක NSE/DEV/EMA/EXR - 002 පරිදි සකස් කරන ලද සාරාංශ වියදම් වාර්තාවක් සෑම මසක් අවසාන වී ඊළඟ මාසයේ 15 වන දිනට පෙර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යැවිය යුතු අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තම දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ විසින් ලබා දෙන ලද උක්ත වාර්තාවට අනුව ආකෘති පත්‍ර අංක NSE/DEV/EMA/EXR – 003 පරිදි සාරාංශ වාර්තාවක් සකස් කර සෑම මසක් අවසාන වී ඊළඟ මස 30 වන දිනට පෙර අධ්‍යක්ෂ, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ලබා දිය යුතුය.

5.4 වැඩිහිටි දීමනාව ගෙවීම සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන ඇතුළත් වැය විෂයයට වැඩිහිටි දීමනාවට අදළ පරිපාලන වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ඇතුළත් නොකළ යුතුය.

5.5 මෙම දීමනාව සෑම මසකම 15 වන දිනෙන් ආරම්භ වී වැඩකරන දින 07ක් තුල සෑම තැපැල් හා උපතැපැල් කාර්යාල මඟින් ගෙවිය යුතුය.

5.7 දිමනාලාභියෙකු කිසියම් සාධාරණ හේතුවක් මත අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් වෙත මාරු වී ඇති අවස්ථාවක, අදාල දිස්ත්‍රික්කය ඇතුළතම හුවමාරුව සිදු වී ඇත්නම් ඒ බව දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා යැවිය යුතුයි. දිස්ත්‍රික් ලේකම්වරු විසින් තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ සිදුවන මාරුවීම් පරිදි ප්‍රතිපාදන ගලපා ගත යුතුය. එමෙන්ම අදාළ දිස්ත්‍රික්කයෙන් වෙනත් දිස්ත්‍රික්කයකට මාරු වී ඇත්නම් ඒ බව සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයටද පිටපතක් සහිතව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත දන්වා එවිය යුතුයි. අදාළ දිමනාව දිමනාලාභියා වෙත අඛණ්ඩව ගෙවීමට හැකිවන සේ දිස්ත්‍රික් අතර මුදල් හුවමාරු කිරීම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් අදාල අමාත්‍යාංශය හරහා සිදු කළ යුතුය.

5.8 දිමනාලාභියකු පදිංචි දිස්ත්‍රික්කයෙන් වෙනත් දිස්ත්‍රික්කයකට මාරු වී ඇති අවස්ථාවක ප්‍රතිපාදන මාරුකර එවනතෙක් අදාල දිමනාලාභියා පදිංචියට පැමිණි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි අධිභාර වූ මුදල් වේනම්, එම මුදලින් එම දිමනාලාභියා වෙත අදාල දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය යටතේ ගෙවීමට කටයුතු කළ යුතුය. අදාල දිස්ත්‍රික් ලේකම් විසින් එම මාරුවීම් පිළිබඳ තොරතුරු කඩිනමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත දන්වා එවිය යුතුය.

5.9 දිමනාව ගෙවීම සම්බන්ධව ලෙජරයක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් ලබා දෙන අතර එය යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය.

5.10 නොගෙවූ වැඩිහිටි දිමනා පිළිබඳ ලේඛනයක් (CR පොතක්) පහත ආකෘතිය පරිදි නඩත්තු කළ යුතුය.

| ගෙවීම් සිදුකරන තැපැල් කාර්යාලය | වෙන්කල ප්‍රතිපාදන (රු.) | නොගෙවන ලද මුදල හා අදාල මාසය | මුදල් ඇණවුම් අංකය | නොගෙවූ නාම ලේඛණය හා අංකය | විෂයභාර නිලධාරි අත්සන | ගණකාධිකාරි අත්සන |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

<u>6. පොරොත්තු ලේඛනය</u>

6.1 අදාල දිමනාලාභීන්ට අමතරව වයස අවුරුදු 70 සම්පූර්ණ වන 2.1 හි සඳහන් සුදුසුකම් ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තොරතුරු ඇතුලත් ලේඛනයක් ප්‍රාදේශීය ලේකම්වරු විසින් පොරොත්තු ලේඛනයක් ලෙස පවත්වාගෙන යා යුතුය. මෙම පොරොත්තු ලේඛණය සඳහා අදාල ප්‍රාදේශීය කමිටුවෙහි අනුමැතිය ලැබී තිබිය යුතුය. මෙහිදී පහත සඳහන් අනුපිළිවෙලට පොරොත්තු ලේඛනයෙහි ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කළ යුතුය.

I. පිළිකා, වකුගඩු රෝග, අංශභාගය, හෘද රෝග, පාකින්සන් වැනි හඳුනාගත හැකි අසාධ්‍ය රෝගී තත්වයන්ගෙන් පෙළෙන පුද්ගලයන්,

II. වයස හා පුද්ගලයින්ගේ අවම ආදායම් මට්ටම අනුව,

III. [illegible]

6.2 දිමනාලාභියකු මියගිය වහාම පොරොත්තු ලේඛනයෙන් ඒ වෙනුවට සුදුසුකම්ලාභියකු ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. පොරොත්තු ලේඛනය සංශෝධනය වන සෑම අවස්ථාවකම ඒ පිළිබඳව ග්‍රාම නිලධාරී දැනුවත් විය යුතුය. එමෙන්ම පොරොත්තු ලේඛනයෙහි සුදුසුකම්ලාභියකු මියගොස් ඇත්නම් ඒ බව ග්‍රාම නිලධාරී විසින් කඩිනමින් ප්‍රාදේශීය ලේකම් වෙත වාර්තා කළ යුතුය.

***7. පසු විපරම් ක්‍රියාවලිය***

7.1 සෑම මසකම 15 වන දිනට මෙම දීමනාව ගෙවීමට හැකිවන ලෙසට රජයේ තැපැල් හා උප තැපැල් කාර්යාලය මඟින් පමණක් ගෙවීමට කටයුතු කළ යුතු අතර, ඒ පිළිබඳව වැඩිහිටි විෂයය සම්බන්ධ අදාළ නිලධාරී විසින් පසු විපරම් කිරීමක් සිදුකළ යුතුය.

7.2 සෑම වර්ෂයකම දෙසැම්බර් 31වන විට දිමනාලාභීන් පිළිබඳව ආකෘති අංක NSE/DEV/EMA/CTE–003 පරිදි දීමනාලාභියා පිළිබඳ දත්ත රැස් කිරීමක් වැඩිහිටි විෂයභාර නිලධාරී විසින් සිදු කළ යුතුය.

ඉහත කාර්යයන් ඉටු කර ගැනීමේදී ඔබ කාර්යාලයට අනුයුක්ත කර ඇති සමාජ සේවා නිලධාරී/ පළාත් සමාජ සේවා නිලධාරී/ වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර/ සංවර්ධන නිලධාරී ගේ සහ අදාල ග්‍රාම නිලධාරීන්ගේ ගේ සම්පූර්ණ සහය ලබාගැනීමට කටයුතු කරන්නේ නම් මැනවි.

ඉංජි. බන්දුල වික්‍රමාරච්චි
ලේකම්
සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය
16 වන මහල, සුහුරුපාය,
බත්තරමුල්ල.

ඉංජි. බන්දුල වික්‍රමාරච්චි
ලේකම්,
සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය

*පිටපත් - 1. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය*
*2. ලේකම් - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය*
*3. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව*
*4. තැපැල්පති - තැපැල් දෙපාර්තමේන්තුව*

සැලකිය යුතු :

- දීමනාලාභියා යනු - මෙම චක්‍රලේඛය යටතේ වැඩිහිටි දීමනාව ලැබීමට සුදුසුකම් ලැබූ තැනැත්තකු මෙයින් අදහස් වේ.
- ප්‍රාදේශීය කමිටුව යනු - කමිටුව යන්න පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත විය යුතුය

  1. ප්‍රාදේශීය ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරන එම කාර්යාලයේ වෙනත් මාණ්ඩලික නිලධාරියකු සභාපති ලෙසද,
  2. සමාජ සේවා නිලධාරි/ සහකාර සමාජ සේවා නිලධාරි/ වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන සහකාර/ සංවර්ධන නිලධාරි යන අයගෙන් අවම වශයෙන් එක් අයකුගෙන්ද,
  3. පරිපාලන ග්‍රාම නිලධාරි ද,
  4. ප්‍රතිලාභියාට අදාල වසමේ ග්‍රාම නිලධාරි,
  5. ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩලයේ නියෝජිතයකුගෙන් ද, (මෙම නියෝජිතයා බලමණ්ඩලයේ යෝජනා ස්ථිරත්වයෙන් පත්විය යුතුය)

  (කමිටුවේ ගණපූර්ණය සභාපති ඇතුළු තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය)

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් එවිය යුතු
  මාසික වියදම් සාරාංශය - NSE/DEV/EMA/EXR – 002
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් එවිය යුතු
  මාසික වියදම් සාරාංශය - NSE/DEV/EMA/EXR – 003
- දීමනාලාභී පිරික්සීමේ ඉල්ලුම් පත්‍රය - NSE/DEV/EMA/CTE – 003

## වයස අවුරුදු 70 ඉක්මවූ අඩු ආදායම්ලාභී වැඩිහිටියන්ට රු.2,000/- ක මාසික දීමනාවක් ගෙවීම.

### ප්‍රාදේශීය කමිටුව සඳහා උපදෙස් මාලාව

- ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 70 සම්පූර්ණ , අඩුආදායම්ලාභී සුදුසුකම් සම්පූර්ණ කරන ලද අය බවට කමිටුව නිර්දේශ කළ යුතුය.

- දීමනාලාභියකු එකම ගෘහයක වරිපනම් අංක 2 ක් යටතේ වෙනම උයා පිහාගෙන කමින් දරුවන්ගෙන් යැපීමක් නොමැතිව , තම දරුවන් සමග හෝ වෙනත් අයකු සමග ජීවත් වන්නේ නම් දීමනාව ලබා දීමට කටයුතු කළ යුතුය.

- වයස අවුරුදු 70 සම්පූර්ණ වී සුදුසුකම් ලබා විවාහක, අවිවාහක, වැන්දඹු , දරුවන් නොමැති ආදී වශයෙන් පුද්ගලයින් කිහිපදෙනෙක් එක ගෘහයක් තුළ ජීවත් වන්නේනම්, ඒ අය සඳහා වෙන් වෙන් වශයෙන් දීමනාව ලබා දීමට කටයුතු කළ හැකි අතර, උපරිමය දෙදෙනෙකුට (02) සීමා විය යුතුය.

- දරුවන් රාජ්‍ය සේවයේ , අර්ධ රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ රැකියාවන්හි නිරත වී සිටින විට, එවැනි දෙමව්පියන් වෙත දීමනාව ලබාදීම පිළිබඳ පහත කරුණු කෙරෙහි ඉතා ගැඹුරින් අවධානය යොමු කරමින් තීරණ ගත යුතුය.

    a. දරුවන්ගේ රැකියාවන්හි ස්වභාවය හා ආදායම් තත්වය,
    b. එකී දරුවන්ගේ යැපෙන්නන් ප්‍රමාණය,
    c. එකී දෙමව්පියන් තම දරුවන් සමග එකම ගෘහයක ජීවත් වන්නේද, දරුවන්ගෙන් ඈත්ව වෙනත් ප්‍රදේශයක ජීවත් වන්නේද යන වග,
    d. දරුවන් විසින් තම දෙමව්පියන් නොසලකා හැර ඇත්ද යන වග,
    e. ඉහත අංක පරිදි (d) හි පරිදි දරුවන් නොසලකයිනම්, එවැනි අය පිළිබඳ නඩත්තු මණ්ඩලය වෙත යොමු කිරීමට කටයුතු කිරීමට යටත් වන වග,

- කිසියම් ප්‍රතිලාභියකු අඛන්ඩව මාස 03 ක් දීමනාව ලබා නොගෙන ඇතිවිට, ඒ පිළිබඳ

# ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
# ஆரம்பக் கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
# MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT

| | | |
|---|---|---|
| මගේ අංකය :<br>எனது இல : NSE/DEV/03/04<br>My No.: | ඔබේ අංකය :<br>உமது இல:<br>Your No. : | දිනය:<br>திகதி: 2019.03. 14<br>Date : |

චක්‍රලේඛ අංක : NSE/EL/01/2018 (1)

සියලුම දිසාපති/දිස්ත්‍රික් ලේකම්වරුන්, පළාත් සමාජ සේවා අධ්‍යක්ෂවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය</u>

<u>වයස අවුරුදු 70 ඉක්මවූ අඩු ආදායම්ලාභී වැඩිහිටියන්ට රු.2,000/- ක මාසික දීමනාවක් ගෙවීම.</u>

මගේ සමාංක හා 2018.10.15 දිනැති චක්‍රලේඛ අංක NSE/EL/01/2018 හා බැඳේ.

එම චක්‍රලේඛයේ 2.1.2 වගන්තිය සහ 3 කරුණ යටතෙහි පවතින වගන්ති පහත පරිදි සංශෝධනය කරමි.

**2.1.2** පවුලේ මාසික ආදායම රු.6,000/- හෝ ඊට අඩු වීම.

**3.** *<u>වැඩිහිටි නිවාසවල සිටින වයස අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන් සඳහා රු.2,000/- ක මාසික දීමනාව ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය</u>*

3.1 ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ / පළාත් සමාජසේවා දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති, නොමිලේ නේවාසිකයන් රැකබලා ගන්නා, වැඩිහිටි නිවාසවල වයස අවුරුදු 70 සම්පූර්ණ වී ඇති ජ්‍යෙෂ්ඨ පුරවැසියන් මෙම දීමනාව ලැබීමට සුදුසුකම් ලබයි.

3.2 මෙහිදී අදාළ මුදල වැඩිහිටි නිවාසයේ පාලක සභාව වෙත ලබා දීමට කටයුතු කළ යුතු අතර, එම මුදලින් රු.1,400/- ක මුදලක් නේවාසික වැඩිහිටියන්ගේ ආහාරපාන සහ අවශ්‍ය ඖෂධ ලබාදීම වෙනුවෙන් යොදවන ලෙසට සහ ඉතිරි රු.500/- ක මුදල ප්‍රතිලාභී නේවාසික වැඩිහිටි පුද්ගලයින්ගේ අතට ලබා දීමට කටයුතු කරන ලෙසටත් උපදෙස් ලබා දිය යුතුය. ඒ අනුව එම මුදල ඉහත කාර්යයන් වෙනුවෙන් වියදම් කළ බවට නිවාසයෙහි පාලක සභාව විසින් සහතික විය යුතු අතරම, වැඩිහිටියන් වෙත මුදල් ලබාදීමේදී එම මුදල් ඔවුන් විසින් ලබාගත් බවට අත්සන් සහිත නාම ලේඛණයක් පවත්වාගෙන යා යුතුය. සුදුසුකම් ලබන නේවාසික වැඩිහිටි සංඛ්‍යාව සහ ඔවුන්ගේ තොරතුරු ඇතුලත් ලේඛනය අදාළ නිවාසයේ පාලකගේ අත්සනින් යුතුව ප්‍රාදේශීය කමිටුවෙහි නිර්දේශය සහිතව සහ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සමගින් ලබා ගත යුතුය.

3.3 සෑම මසකම ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව දීමනාව ලබන නේවාසිකයින්ගේ ගෙවීම් නාම ලේඛනයෙහි පිටපතක් පළාත් සමාජසේවා අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය.

3.4 මෙම දෙනු ලබන මුදල් ඉහත 3.2 හි සඳහන් කාර්යයන් වෙනුවෙන් යොදවන්නේද පිළිබඳව වැඩිහිටි විෂයය සම්බන්ධ අදාළ නිලධාරි විසින් පසු විපරම් කිරීමක් සිදුකළ යුතුය.

එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්,
ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්
ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම
අමාත්‍යාංශය
I වන මහල, සෙත්සිරිපාය - II අදියර
බත්තරමුල්ල.